*සැ. යු.-* 2024.02.22 දින පළකරන ලද අංක 2373 *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,374 - 2024 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2024.03.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 48 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මාර්තු 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.”**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## හලාවත දිසා අධිකරණය

### අංක 6375/MB දරන නඩුවට අදාළව හලාවත දිසා අධිකරණයේ ඇ/අංක 01/24 යටතේ පිස්කල් මගින් කරනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දන් පත්තුවේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා සීමාව තුළ රාජකඳළුව ලෙස සඳහන්ව තිබුණ ද ආරච්චිකට්ටුව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත් ආරච්චිකට්ටුව රාජකදළුව නමැති ගමේ පිහිටි ''ඇන්ටන්විලාවත්ත''නමැති ඉඩමට, වර්නන් පෙරේරා බලයලත් මානක තැන විසින් 1991.01.07 වැනි දින මැන සාදන ලද අංක 6551 දරන පිඹුරේ ලොට් අංක 81 දරන ඉඩම් කොටසට මායිම් :

උතුරට : ලොට් අංක 84 දරන කොටස ද, නැගෙනහිරට : ලොට් අංක 82 දරන කොටස ද, දකුණට : ලොට් අංක 80 දරන කොටස ද, බස්නාහිරට : ලොට් අංක 181 දරන කොටස ද, (පාර) ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි, ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග වේ.

ඉහත කී ඉඩම පහත පරිදි නැවත මැන සාද ඇත.

ආරච්චිකට්ටුව රාජකදළුව නමැති ගමේ පිහිටි ''ඇන්ටන්විලාවත්ත'' නමැති ඉඩමට, එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර බලයලත් මානක තැන විසින් 2013.09.19 වැනි දින මැන සාදන ලද අංක 2576 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම් :

උතුරට : වර්නන් පෙරේරා බලයලත් මානකගේ අංක 6551 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 84 දරන කොටස ද, නැගෙනහිරට: වර්නන් පෙරේරා බලයලත් මානකගේ අංක 6551 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 82 දරන කොටස ද, දකුණට : වර්නන් පෙරේරා බලයලත් මානකගේ අංක 6551 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 80 දරන කොටස ද, බස්නාහිරට : වර්නන් පෙරේරා බලයලත් මානකගේ අංක 6551 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 181 දරන ප්‍රාදේශීය සභා පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි, ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග වේ.

*ඉඩමේ ප්‍රමාණය.*- පර්චස් 20 - මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 23/51 හි ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.*- හලාවත පුත්තලම A3 ප්‍රධාන මාර්ගයේ කි. මී. 14.6ක් පමණ දුරක් ගමන් කළ විට හමුවන ආරච්චිකට්ටුව නගරයේ දුම්රිය ස්ථානය පාරේ (ආරච්චිකට්ටුව ඉන්ධන පිරවුම්හලට වම් පසින් ඇති මාර්ගය) මීටර් 350 ක් පමණ යන විට හමුවන ප්‍රජා ශාලාව පිහිටි Y හන්දියෙන් වමට හැරී මීටර් 50 ක් පමණ යනවිට වම් පසින් හමුවන තෙවන මාර්ගයේ වම්පසින් (08 වන ඉඩම) වෙන්දේසි කිරීමට නියමිත දේපළ පිහිටා ඇත.

නියෝජ්‍ය පිස්කල් විසින් **2024 අප්‍රේල් මස 05 වැනි දින පෙ. ව. 11.00** ට දේපළ පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. පිස්කල් කොමිස් මුදල, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන කොමිස් මුදල,
4. සියලුම ප්‍රචාරක ගාස්තු,
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500/-,
6. වෙන්දේසිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

* අදළ දේපළ විකිණීම උසාවිය අනුමැතිය මත සිදු වේ.

ගැනුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළයුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් මුදලින් තැන්පත් කළ මුදල් ආපසු නොගෙවන අතර දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙතින් ලබාගත හැක.

දුරකථන අංක : 032-2253300, 032-2253301, ෆැක්ස් : 032-2255247.

රෙජිස්ට්‍රාර් නි/පිස්කල්,
දිසා අධිකරණය,
හලාවත.

03-83

---

කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

**පිස්කල් වෙන්දේසියේ විකිණීමයි**

ලංකා ඔරික්ස් කම්පැනි පීඑල්සී,
(කලින් : ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි ලිමිටඩ්, යනුවෙන් නම්කර හඳුන්වනු ලැබූ)
අංක : 100/1-1/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
(සමාගමේ නව අංකය PQ 70)

*නඩු අංකය* : HC (සිවිල්) 210/2009 එම්.ආර්.
*ඇස්කීසි අංකය* : 37/2019

*.....................පැමිණිලිකරු.*

*එදිරිව*

01. ජෙෆ්රි නුරුල් අමීන්,
අංක 5,2/3, කන්දෙවත්ත ටෙරන්ස්,
නුගේගොඩ.

*නව ලිපිනය:*

අංක 5/7, කන්දෙවත්ත ටෙරන්ස්,
නුගේගොඩ.

02. ක්‍රිස්ටීන් ඇන් ජෙෆ්රි,
අංක 71/ඒ/22, 4 වන පටුමග, ලේක් ක්‍රෙසන්ට්,
කවුඩාන පාර, දෙහිවල.

*.....................විත්තිකරුවන්.*

වර්ෂ 2011ක් වූ ජූනි මස 16 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී 01 වන, 02 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට එක්ව සහ/හෝ වෙන් වෙන්ව අයකර ගන්නට කියා නියම කළ රුපියල් 7,474,492/-ක මුදලක් සහ රු. 7,160,653/- ක මුදලක් ඒ මත 2009.04.03 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් වර්ෂයකට 48% බැගින් පොලිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා ද, 01 වන සහ 02 වන විත්තිකරුවන් විසින් එක්ව සහ හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට එම අධිකරණයේ නිලධාරියෙකු විසින් පත් කරන ලද නඩු ගාස්තු අය කර ගැනීම සඳහා එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් වන විත්තිකරු වන ජෙෆ්රි නුරුල් අමීන් යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට

අදළ සෑම සියලු දේ කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය පිස්කල් වන මා විසින් **වර්ෂ 2019ක් වූ ජූලි මස 05 වැනි දින** කර ඇති තහනමට යටත් ව,

**වර්ෂ 2024ක් වූ මාර්තු මස 28 වැනි දින ප. ව. 2.00** ට 01 වන විත්තිකරුට අයත් මෙම දේපළ පිහිටා ඇති,

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ, දෙල්දූව වාද්දු වස්කඩු දෙබැද්ද දෙල්දූව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගල්පොත්තහේන *හෙවත්* ගල්පොත්තවත්ත *හෙවත්* බේරුවලගේවත්ත නමැති ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිහිටීම.*- මෙම ඉඩම ගාලු පාරේ වාද්දුව නගරය පසු කර වාඩියමංකඩ හන්දියෙන් (බණ්ඩාරගම පාර) ඔස්සේ කි. මී. 2.3ක් ගමන් කරන විට දකුණුපස ඇති දෙල්දූව විද්‍යාලය පසු කරනවාත් සමග දකුණට ඇති පාරේ මීටර් 500ක් ගමන් කරන විට අදළ දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් (i) ගැනුම් මිලෙන් සියයට විසි පහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට (අ) අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලු වියදම් මුදලින් ගෙවිය යුතු ය. ගැනුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ දෙල්දූව වාද්දු වස්කඩු දෙබැද්ද දෙල්දූව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගල්පොත්තහේන *හෙවත්* ගල්පොත්තවත්ත *හෙවත්* බේරුවලගේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. එස්. සී. විතාන මහතා විසින් මැන සාදන ලද වර්ෂ 2006.10.25 වැනි දිනැති සහ අංක 2371 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : අඩි 20ක් පළල පාර 667ඒ පිඹුරේ ලොට් 13) සහ ලොට් 34 (667/ඒ පිඹුරේ) ද, නැගෙනහිරට : 667/ඒ පිඹුරේ ලොට් 34 සහ ලොටවේ එස්ටේට් *හෙවත්* කෝපියවත්ත (පී. පී. 12845) ද, දකුණට : 845 පිඹුරේ ලොට් 12 සහ 13 ද, බස්නාහිරට : 845 පිඹුරේ ලොට් 4 සහ අඩි 10ක් පළල පාර ද, මායිම් වූ රූඩ් දෙකයි පර්චස් දහයයි දශම හතයි පහක් (රූ. 02, පර්. 10.75) ක ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද බිම් කැබැල්ල සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ ද සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම-පත්‍රිරු G 203/23 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය - කොළඹ.

වර්ෂ 2024ක් වූ පෙබරවාරි මස 20 වැනි දින දී ය.

03-108

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.02.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2024.05.03 | සිකුරාදා | 2024.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.10 | සිකුරාදා | 2024.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.17 | සිකුරාදා | 2024.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.22 | බදාදා | 2024.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.31 | සිකුරාදා | 2024.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.